# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 7 ශ්‍රේණිය | ගණිතය | ඒකකය : 15 - සමීකරණ හා සූත්‍ර |
|---|---|---|


### I කොටස

1) x + 8 = 18 සමීකරණය විසඳන්න.

2) 5y – 1 = 14 සමීකරණය වසඳන්න.

3) a ගෙන් 2ක් අඩු කල විට පිළිතුර 6ක් වේ. ප්‍රකාශය සඳහා සමීකරණයක් ගොඩ නගන්න.

4) පරිමිතිය ඒකක P වූ සමචතුරස්‍රයක පාදයක දිග ඒකක x වේ.
P හා x අතර සම්බන්ධය දැක්වෙන සූත්‍රය ගොඩනගන්න.




5) සමපාද ත්‍රිකෝණයක පාදයක දිග ඒකක a නම් එහි පරිමිතිය P සඳහා සූත්‍රයක් ගොඩ නගන්න.

### II කොටස

1. a) පහත සඳහන් අවස්ථා සඳහා සමීකරණ ගොඩ නගන්න.
   - i) x ගේ දෙගුණයට 5 එකතු කළ විට ප්‍රතිඵලය 27 කි.
   - ii) y තුනෙන් බෙදා 4ක් එකතු කළ විට x හි හරි අඩකට සමාන වේ.

   b)
   - i) 5x + 3 = 23 ගැලීම් සටහන ඇසුරින් විසඳන්න.
   - ii) 4x – 5 = 19 වීජීය ක්‍රමයෙන් විසඳන්න.
   - iii) y = mx සූත්‍රයේ m = 2
     x = 5 නම් y හි අගය සොයන්න.

2. i) එකම මිල වූ පොත් 4ක් සහ රුපියල් 8 බැගින් වූ පැන්සල් 3ක් මිල දී ගැනීමට රුපියල් 96 ක් වැය විය. සමීකරණයක් ගොඩ නගා පොතක මිල සොයන්න.

   ii) කිරි පිටි පැකට් නිපදවන යන්ත්‍රයක් පළමු පැය තුළදී පැකට් x ප්‍රමාණයක්ද, ඊට පසු සෑම පැයකටම පැකට් හ ප්‍රමාණයක්ද නිපදවයි නම් පැය t කාලය දී නිපද වූ පැකට් ගණන P සඳහා x, y හා t ඇසුරින් සූත්‍රයක් ගොඩ නගන්න.